ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව

රත්නපුර දිස්ත්‍රික්කය

--------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 30 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 26 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 අගෝස්තු 21 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

---------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව එකතුව රු. 70,421 ක් වූ ස්ථාවර වත්කම් ඉවත්කිරීමට නිර්දේශ කර තිබුණද, ඒවා ඉවත් කිරීමකින් තොරව ගිණුම් වලින් ඉවත්කර තිබීම හේතුවෙන් ස්ථාවර වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී මිලදීගෙන තිබුණු රු. 15,500 ක් වූ වතුර ටැංකියක් ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගතකර නොතිබීම හේතුවෙන් ස්ථාවර වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුලදී මිලදීගෙන තිබූ එකතුව රු. 147,095 ක් වූ පාරිභෝජ්‍ය ද්‍රව්‍ය ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් ස්ථාවර වත්කම් එම ප්‍රමාණයෙන් වැඩිපුර දැක්වුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී මිලදී ගෙන තිබුණු කබඩ් 08 ක්, කබඩ් 10 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් ස්ථාවර වත්කම් රු. 32,317 කින් වැඩියෙන් දැක්වුණි.

(ඉ) වර්ෂය තුල ලැබී තිබුණු රු. 233,200 ක් වූ ආයුර්වේද ඖෂධ රු. 227,100 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් ආදායම රු. 6,100 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේදී කලින් ලැබූ වරිපනම් බදු රු. 16,497 ක් අඩුවෙන් සටහන් කිරීම නිසා වගකීම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේදී පරිත්‍යාග වශයෙන් ලැබී තිබූ එකතුව රු. 60,490 ක් වූ පුස්තකාල පොත් 140 ක් ගිණුම් වලින් අත්හැරීම හේතුවෙන් ස්ථාවර වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

**1.3.2 නොසැසඳූ පාලන ගිණුම්**

**----------------------------**

ගිණුම් විෂයයන් 06 කට අදාලව සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් සහ උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු. 550,132 ක වෙනසක් විය.

**1.3.3 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම**

**-----------------------------------------------------**

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම් |
| --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 571 හා 571(2) | 2013 වර්ෂයේ සිට 2014 නොවැම්බර් 22 දින දක්වා කාලපරිච්ඡේදයට අදාලව එකතුව රු. 682,840 ක් වූ තැන්පතු නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ I කාණ්ඩයේ XXIV පරිච්ඡේදයේ 4:1 වගන්තිය | ස්ථාන මාරුවී ගිය හා විශ්‍රාම ගිය නිලධාරීන් 12 දෙනෙකුගෙන් අයකරගත යුතු එකතුව රු. 64,223 ක් වූ ණය ශේෂ අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු. 17,706,045 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු. 10,449,768 ක් වූ බැවින් ඉකුත් වර්ෂයට සාපේක්ෂව මූල්‍ය ප්‍රතිඵලයේ රු. 7,256,277 ක වර්ධනයක් දක්නට ලැබුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

මූල්‍ය ප්‍රතිඵලය රු. 7,256,277 කින් වැඩිවීම කෙරෙහි ආදායම් විෂයයන් 04 ක රු. 8,803,922 ක වර්ධනය ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| ------------------ | ------------------- | ------ | ----------------------- |
| | රු. | රු. | රු. |
| | 000’ | 000’ | 000’ |
| වරිපනම් හා බදු | 3,169 | 6,450 | 5,729 |
| බදු කුලී | 8,129 | 9,691 | 605 |
| බලපත්‍ර ගාස්තු | 1,382 | 1,474 | 10 |
| වෙනත් ආදායම් | 47,992 | 38,713 | 18,772 |

**2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

**----------------------------------------**

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම, රැස්කල ආදායම සමඟ සැසඳීමේදී වරිපනම් බදු, බදුකුලී ආදායම, බලපත්‍ර ගාස්තු හා සේවා සඳහා ගාස්තු යන ආදායම් විෂයයන්ගෙන් රැස්කල ආදායම අයවැයගත ප්‍රමාණයට වඩා පිළිවෙලින් සියයට 69, සියයට 16, සියයට 06 හා සියයට 20 කින් වැඩි වී තිබූ අතර වරෙන්තු හා දඩ, වෙනත් ආදායම් හා රජයේ දායකත්වය යන ආදායම් විෂයයන්ගේ රැස්කල ආදායම අයවැයගත ප්‍රමාණයට වඩා පිළිවෙලින් සියයට 09, සියයට 68 හා සියයට 42 කින් අඩුවී තිබුණි.

**2.3.3 වරිපනම්**

**----------**

2016 සැප්තැම්බර් 30 දින වනවිට වරිපනම් ඒකක 1426 කින් එකතුව රු. 1,816,516 ක් වූ හිඟ වරිපනම් බදු අයවිය යුතුව පැවතුණි.

**2.3.4 බලපත්‍ර ගාස්තු**

**----------------**

2016 දෙසැම්බර් 31 දින වනවිට ව්‍යාපාර බදු, කර්මාන්ත බදු හා වෙළඳ බලපත්‍ර ආදායම් රු. 257,280 ක් හිඟව පැවතුණි.

**2.3.5 වෙනත් ආදායම්**

------------------

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 1986 නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් සහ ගොඩනැගිලි නියෝගයන්ට කරන ලද සංශෝධනයන්හි V වන උපලේඛනය පරිදි දුරකථන සම්ප්‍රේෂණ කුළුණු ඉදිකිරීමේදී ආයතන 04 කින් අයකල යුතු ගාස්තු රු. 704,070 ක් අඩුවෙන් අයකර තිබුණි.

**2.3.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව වෙනුවෙන් 2016 ඔක්තෝබර් 21 දින වනවිට සබරගමුව පළාත් සභාවට ලැබී තිබූ එකතුව රු. 5,978,127 ක් වූ උසාවි දඩ මුදල් සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

(ආ) ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල 03 කට අදාලව 2014 ජූලි සිට 2016 දෙසැම්බර් දක්වා සභාවට හිමි මුද්දර ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

**3.1 කාර්යසාධනය**

-----------------

සමාලෝචිත වර්ෂයේ වාර්ෂික අයවැය ලේඛනය අනුව සභා අරමුදල් සහ වෙනත් අරමුදල් යටතේ පිළිවෙලින් රු. 8,137,307 ක් හා රු. 30,000,000 ක් වශයෙන් එකතුව රු. 38,137,307 ක් සංවර්ධන කටයුතු සඳහා ඇස්තමේන්තු කර තිබූ අතර, සංවර්ධන කටයුතු වෙන් වෙන් වශයෙන් හඳුනාගෙන නොතිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වනවිට සභා අරමුදල් සහ වෙනත් අරමුදල් වලින් පිළිවෙලින් රු. 4,806,340 ක් හා රු. 538,459,195 ක් වශයෙන් එකතුව රු. 543,265,535 ක් වැයකර ව්‍යාපෘති 306 ක් සිදුකර තිබුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

-----------------------------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 (1) උප වගන්තිය ප්‍රකාරව ඉඩම් වෙන්දේසියකදී විකුණන ලද බිම් කොටස් වල විකුණුම් වටිනාකමින් සියයට 1 ක බදු මුදලක් සභාව වෙත අයකර

ගතයුතු වුවත්, 2013 වර්ෂයේදී සභා බල ප්‍රදේශය තුල සිදුකර තිබූ ඉඩම් වෙන්දේසියකට අදාලව බදු මුදල් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

## 3.3 අවිධිමත් ගනුදෙනු

2006 වර්ෂයේ ගිවිසුම්ගතවූ වීරසිංහපුර කණුවැදිආර මාර්ගය සංවර්ධනය කිරීමේ කර්මාන්තය සඳහා වැඩ අවසන් වාර්තාවක් ඉදිරිපත් කර නොතිබියදී 2010 සහ 2016 යන වර්ෂයන්හීදී පිළිවෙලින් රු. 100,000 ක් හා රු. 386,147 ක් වශයෙන් පළමු හා අවසන් ගෙවීම් කර තිබුණි.

## 3.4 කොන්ත්‍රාත් පරිපාලනය

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2015 දෙසැම්බර් 30 දිනැති අංක FC/3/3/2015 දරන මුදල් කොමිෂන් සභා චක්‍රලේඛයේ 1.2 ඡේදය ප්‍රකාරව මාර්ග ඉදිකිරීමේදී බොරළු දැමීම වැනි තාවකාලික ක්‍රියාමාර්ග සිදු නොකල යුතු වුවද, විගණනය විසින් සිදුකල නියැදි පරීක්ෂාවට අනුව සභාව විසින් එකතුව රු. 1,933,495 ක් වැයකර මාර්ග 03 ක් බොරළු යොදා සංවර්ධනය කර තිබුණි.

(ආ) ගිවිසුම්ගත වටිනාකම රු. 488,100 ක් වූ වැලිපතයාය 2 කණුව මාර්ගය බොරළු යෙදීමේ කර්මාන්තය සම්බන්ධයෙන් 2016 නොවැම්බර් 23 දින සිදුකල භෞතික පරීක්ෂාවේදී, ගෙවීම් කර තිබූ මීටර් 800 ක් වූ දුර, කොටස් 03 කින් සමන්විත වූ බව දැක්වූවත් එම දුර ප්‍රමාණය නිශ්චිතව පෙන්වීමට කාර්මික නිලධාරීවරයා අපොහොසත් වූ අතර, මාර්ගය සඳහා ඇස්තමේන්තු සැකසීමේදී හෝ ගෙවීම් බිල්පත් පිළියෙල කිරීමේදී සංවර්ධනය කරන කොටස් පිළිබඳව රූප සටහන් මඟින් හෝ ලිඛිතව පැහැදිලි කිරීම් කර නොතිබුණි.
තවද, අනුමත නොකල සුදු පැහැති බොරළු වර්ගයක් කර්මාන්තය සඳහා භාවිතා කර තිබුණි. මාර්ග තලයේ පළමු මීටර් 72 ත් අවසාන මීටර් 100 ත් තුල මාර්ග තලය නිසි පරිදි මට්ටම් කිරීම සහ තැලීම සිදුකර නොතිබූ අතර, භාවිතා කරන ලද බොරළු වලින් ඉවත් කරන ලද ගල් වලින් මාර්ග උරහිස දෙපස ගොඩකර තිබුණි.

(ඇ) ගිවිසුම්ගත වටිනාකම රු. 476,704 ක් වූ වීරසිංහපුර ගම්මානය මාර්ගය බොරළු යොදා සංවර්ධනය කිරීමේ කර්මාන්තය සම්බන්ධයෙන් 2016 නොවැම්බර් 23 දින සිදුකල භෞතික පරීක්ෂාවේදී මාර්ගයේ බොරළු යෙදීමෙන් පසු නිසි පරිදි නොතැලීම හේතුවෙන් වර්ෂාවත් සමඟ මාර්ග තලයේ දෙපස අයින් බොහෝ ස්ථාන ඛාදනය වී ගොස් තිබූ අතර, මාර්ග තලයේ ස්ථාන 07 කින් එකතුව මීටර් 184 ක් වූ දුර ප්‍රමාණයක් සේදී ගොස් තිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

---------------------------------------

### 4.1 අයවැය පාලනය

-----------------

සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 28 කට අදාලව එකතුව රු. 568,000 ක් වූ මුළු ප්‍රතිපාදනයම උපයෝජනය කර නොතිබුණි.

### 4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

------------------------------

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සභාව විසින් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

### 4.3 අභ්‍යන්තර විගණනය

----------------------

සමාලෝචිත වර්ෂයේ අභ්‍යන්තර විගණනය සිදුකිරීම සඳහා විෂයයභාර නිලධාරියෙකුට වැඩ පැවරීමක් සිදුකර අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා තිබුණද, එම ඒකකය ක්‍රියාත්මක කර නොතිබුණි.

### 4.4 විගණන හා කළමනාකරණ කමිටු

------------------------------------

විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා ක්‍රියාත්මක කිරීම සඳහා පියවර ගෙන නොතිබුණි.

### 4.5 නොවිසඳී ඇති හා පිළිතුරු නොදුන් විගණන විමසුම්

-------------------------------------------------------

2016 දෙසැම්බර් 31 දින වනවිට ගණනය කල හැකි වටිනාකම රු. 11,811,573 ක් වූ විගණන විමසුම් 04 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලනය

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

| | පද්ධතිය | | නිරීක්ෂණය |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය | (i) | ස්ථාවර වත්කම් අඩුවෙන් සටහන් කිරීම |
| | | (ii) | ස්ථාවර වත්කම් වැඩියෙන් සටහන් කිරීම |
| | | (iii) | වර්ගීකරණ දෝශ තිබීම |
| | | (iv) | වගකීම් වැඩියෙන් සටහන් කිරීම |
| | | (v) | ආදායම් අඩුවෙන් සටහන් කිරීම |
| (ආ) | ආදායම් පරිපාලනය | | නියමිත ආදායම අයකර නොගැනීම |
| (ඇ) | කොන්ත්‍රාත් පරිපාලනය | | ඉටු නොකල කාර්යයන් සඳහා ගෙවීම් කිරීම |
| (ඈ) | අයවැය පාලනය | | ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම |